10.31357/fhssmst.2007.00012

# 14 - 16 සියවස්හි ලියවුණු සිංහල වංශ කථා

# සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්

සෙනරත් අච්චිගේ සෝමලතා සෙනරත්

ලේඛ්‍යාරූඪ අංකය : **GS/HU/1517/2002**

ශාස්ත්‍රපති 2007

# 14 - 16 සියවස්හි ලියවුණු සිංහල වංශ කථා සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්

සෙනරත් අච්චිගේ සෝමලතා සෙනරත්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා සිංහල විෂය යටතේ

ඉදිරිපත් කරන සංශෝධිත නිබන්ධය යි.

## අපේක්ෂක ප්‍රකාශය

"මෙම සංශෝධිත නිබන්ධයේ අන්තර්ගතය පූජ්‍ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, පරීක්ෂකවරුන් විසින් පෙන්වා දෙනු ලැබූ සියලු සංශෝධන මීට ඇතුළත් කරනු ලැබූ බවත්, මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ අනෙක් ආයතනයකට හෝ වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නො කරන ලද බවත් සහතික කරමි."

2013.05.06. ............................................................

දිනය අපේක්ෂක

## උපදේශක ප්‍රකාශය

අයදුම්කරු විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රකාශය සත්‍ය බව ද, පරීක්ෂකවරුන් විසින් පෙන්වා දෙනු ලැබූ සියලු සංශෝධන ඇතුළත් කර ඇති මෙම සංශෝධිත නිබන්ධය ඇගයීම් සඳහා විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කිරීමට සුදුසු බව ද ප්‍රකාශ කරමි.

2013/05/06 .......................

දිනය

.......................

උපදේශක

# පටුන


| | |
|---|---|
| අපේක්ෂක ප්‍රකාශය | |
| උපදේශක ප්‍රකාශය | |
| පටුන | i |
| ස්තුතිය | ii - iii |
| නිබන්ධ සාරාංශය | iv - v |
| හැඳින්වීම | 1 - 3 |
| සාහිත්‍ය සම්පත් සමීක්ෂාව | 4 - 5 |
| පර්යේෂණ ක්‍රමවේදය | 6 - 9 |
| **පළමු වන පරිච්ඡේදය** | |
| 14 - 16 සියවස්හි ලියවුණු සිංහල වංශ කථා | 10 - 40 |
| **දෙවන පරිච්ඡේදය** | |
| සිංහල වංශ කථාවන්හි භාවිත භාෂාව | 41 - 61 |
| **තෙවන පරිච්ඡේදය** | |
| සිංහල වංශ කථාවන්හි ඓතිහාසික අගය | 62 - 81 |
| **සිව්වන පරිච්ඡේදය** | |
| සිංහල වංශ කථා මගින් නිරූපිත සමාජ සංස්කෘතිය | 82 - 93 |
| **පස්වන පරිච්ඡේදය** | |
| සිංහල වංශ කථා මගින් නිරූපිත කලා ශිල්ප | 94 - 99 |
| නිගමනය | 100 - 102 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 103 - 108 |
| උපග්‍රන්ථය | I - XIV |

# ස්තුතිය

"14 - 16 සියවස්හි ලියවුණු සිංහල වංශ කථා සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්" මැයෙන් ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා නිබන්ධ මාතෘකාව අනුමත කර ගැනීමට ලැබීම සතුටකි. මෙහි දී මානව ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිතුමා ඇතුළු පශ්චාද් උපාධි අධ්‍යයන මණ්ඩලයට මාගේ ප්‍රණාමය හිමි වේ.

පර්යේෂණ කාර්යයේ දී මූලික උපදෙස් සංක්ෂිප්ත ව ලබා දෙමින්, පර්යේෂණ ක්‍රමවේදයට අවැසි ශාස්ත්‍රීය මග පිළිබඳ ව මා දැනුවත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් ගුරුපියාණන්ට ගෞරවණීය කෘතඥතාවය පිරිනැමිය යුතු ය. අදාළ මාතෘකාව තෝරා ගැනීමේ දී උපදේශකත්වයෙන් මග පෙන් වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පූජ්‍ය කිවුලේගෙදර නාරද හිමියනට ද ගෞරවණීය ස්තුතිය පිරිනැමිය යුතු යි. අධ්‍යයන කාර්යයේ දී උපදේශක හිමිනමක ලෙස කටයුතු කරමින්, ශාස්ත්‍රීය නිබන්ධයකට අවැසි මග දයා කරුණාවෙන් පෙන්වා දෙමින්, අධ්‍යයන උපදෙස් හැකි හැමවිට ම ලබා දෙමින්, උන් වහන්සේ දුන් මාර්ගෝපදේශකත්වය මම ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

මා විසින් ඉදිරිපත් කරන ලද නිබන්ධය සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට උපදෙස් ලැබුණි. එම අවස්ථාවේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විනී විතාරණ ගුරු පියාණන් ලබා දුන් මඟ පෙන්වීම සඳා ණයගැති භක්තියකින් යුතු ව සිහිපත් කරමි.

හමුවන සෑම විට ම අධ්‍යයන කටයුත්තට ආශිර්වාදයෙන් මා දිරිමත් කළ, ජයවර්ධනපුර සරසවියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල ගුරුමෑණියන් ද ගෞරවයෙන් සිහිපත් කරමි. මෙම කාර්යයේ දී සිංහල අධ්‍යයනාංශ ප්‍රධානතුමාගේ පටන්, කාර්යාල සේවක මහතා දක්වා සියලු දෙනා ද, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ නිලධාරීන් හා සෙසු කාර්ය මණ්ඩලයෙන් ද ලැබුණු පුංචි උපකාර ද මට විශාල පිටුවහලක් විය.

අධ්‍යයන කාර්යයන්හි වටිනාකම නිබඳ අගයමින් ඉඩ ලද හැම අවස්ථාවක ම මා ධෛර්යවත් කළ පාසල්කාලීන ගුරුවරියක වූ, විශ්‍රාමලත් චන්ද්‍රා ගුණරත්න ගුරු මෑණියන් කෘතවේදී ව සිහිපත් කරමි.

නිබන්ධය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ දී සහාය දැක් වූ, විද්‍යෝදය පුස්තකාලයාධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලය, කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පුස්තකාලයාධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ස්තුති පූර්වක ව සිහිපත් කළයුතු ව ඇත. සෙසු පුස්තකාලවලින් ලැබුණ සහයෝගය ද අමතක නො කරමි. සිංහල වංශ කථා සම්බන්ධ මුද්‍රිත පොත් පිළිබඳ කරුණු සෙවීමේ දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය අතිමහත් ය. පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය ද අගයමි.

අධ්‍යයන කාර්යය සඵල කර ගැනීමට අවශ්‍ය වටපිටාව රිසි සේ ලබා දෙමින් නිවැසියන් කළේ අල්ප වූ මෙහෙයක් නො වේ. ඉහළ පාසල් අධ්‍යාපනයක් නො ලැබුව ද, ශක්තිමත් අඩිතාලමක් ලබා දී අපේ ජීවිත සවිමත් කළ, සතර බඹ විහරණයේ සැබෑ ප්‍රතිමූර්තියක් ම වන, ජීවිතයේ සැඳෑ සමය ගෙවමින් සිටින, මගේ ආදරණීය මෑණියන්ගේ නිහඬ ආශිර්වාදය මා කිසි දිනක පරාජිතයකු නො කරන අයෝමය ශක්තියක් බව ද සිහිපත් කළ යුතු ම ය. පර්යේෂණ කර්තව්‍ය සාර්ථක කර ගැනිම සඳහා නන් අයුරින් උපකාර කළ සැමට ද, පොත මනාව සකස් කර දුන් අය ඇතුළු පරිගණක මුද්‍රණ කටයුතු කර දුන් සියලු දෙනාට ද මාගේ භක්ති පූර්වක ස්තුතිය මම පිරිනැමීමට කැමැත්තෙමි.

එස්.ජී.එස්. සෙනරත්

# 14 - 16 සියවස්හි ලියවුණු සිංහල වංශ කථා

# සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්

**එස්.ඒ.එස්. සෙනරත්**

## සංශෝධිත නිබන්ධ සාරාංශය


මා විසින් ඉදිරිපත් කරන ලද නිබන්ධය සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට උපදෙස් ලැබුණි. මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ උපදේශකත්වය යටතේ හා පරීක්ෂක මහාචාර්යවරුන් වන විනී විතාරණ හා විමල් විජේරත්න ගුරු පියවරුන් විසින් පෙන්වා දෙන ලද සංශෝධන සහිත ව මෙම නිබන්ධය නැවත සකස් කර තිබේ.

මුල් කොටස අපේක්ෂක ප්‍රකාශය, උපදේශක ප්‍රකාශය, පටුන, ස්තුතිය, නිබන්ධ සාරාංශය, හැඳින්වීම, සංකේත භාවිතය, සාහිත්‍ය සම්පත් සමීක්ෂාව, පර්යේෂණ ක්‍රමවේදය යන අංගයන්ගෙන් සමන්විත වේ. මධ්‍ය කොටසට ඇතුළත් වන්නේ පර්යේෂණාත්මක දත්ත විමර්ශනය යි. එය පරිච්ඡේද පහකින් සමන්විත යි. පිටු එකසිය අටකින් යුක්ත යි. නිගමනය හා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ද ඊට ඇතුළත් ය. අග කොටසින් අධ්‍යයනයට සම්බන්ධ අමතර කරුණු දැක්වෙයි.

14 - 16 සියවස්වලට අයත් කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ සමයන්හි රචිත සිංහල වංශ කථා නාමයෙන් යුත්, වංශ කථා කිහිපය වන **ස්තූප වංශය, සිංහල බෝධි වංශය, අනාගත වංශය, ගම්පොළ සමයේ රචිත එළු අත්තනගලු** වංශය හා **කෝට්ටේ සමයේ රචිත විදාගම එළු අත්තනගලු** වංශය, **චූල බෝධි** වංශය පිළිබඳ විස්තර පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලි හා අදාළ මුද්‍රිත සංස්කරණ ග්‍රන්ථ ආශ්‍රයෙන් ඉදිරිපත් කෙරෙයි. ඒ යටතේ එකිනෙක වංශ කථාව හඳුන්වා, ඒවායේ අන්තර්ගතය පිළිබඳ විස්තර දක්වා, එකිනෙක වංශ කථාවල මුද්‍රිත සංස්කරණය පිළිබඳ ලේඛනයක් ද ඇතුළත් කර තිබේ. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී, අමුද්‍රිත වංශ කථා වශයෙන් හඳුනා ගත්, **අනාගත** වංශ **කාව්‍යය** හා **සේරුවාවිල ස්තූප** වංශය පිළිබඳ තොරතුරු ද ඊට ම ඇතුළත් ය.

දෙවන පරිච්ඡේදයෙන් සිංහල වංශ කථාවන්හි භාවිත භාෂාව පිළිබඳ විමසා බැලෙයි. එම ග්‍රන්ථයන්හි ඓතිහාසික අගය විමසීම තෙවන පරිච්ඡේදය යටතේ දැක්වෙයි. ඒ යටතේ සිංහල වංශ කථාවන්හි ශාස්ත්‍රීය වටිනාකම පිළිබඳ සාකච්ඡා කෙරෙයි. සිංහල වංශ කථා මගින් නිරූපිත සමාජ සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය සිව්වන පරිච්ඡේදය මගින් දැක්වේ. පස්වන පරිච්ඡේදයෙන් විමර්ශනය කෙරෙන්නේ සිංහල වංශ කථා මගින් නිරූපිත කලා ශිල්ප පිළිබඳ තොරතුරු යි.

පරිච්ඡේද අවසානයේ දැක්වෙන්නේ නිගමනය යි. එය සංක්ෂිප්ත වශයෙන් මෙසේ ය. සිංහල වංශ කථා පාලි වංස කථා ඇසුරින් බිහි වන්නට ඇති බව පොදුවේ පවත්නා අදහස යි. එසේ වුව ද, මෙම අධ්‍යයනයේ දී, ඇතැම් පාලි වංස කථා සිංහල වංශ කථා ආශ්‍රයෙන් රචනා වී ඇති බව ද, එසේ රචනා වූ පාලි වංස කථා ඇසුරෙන් සිංහල වංශ කථා බිහි වී ඇති බව ද හඳුනා ගන්නට ලැබිණි. නිදර්ශන වශයෙන් **ස්තූප වංශ** කිහිපයක් ම හඳුනා ගන්නට ලැබුණ අතර, ඒවායෙහි පුරාණ රචනය වන්නේ සිංහල වංශ කතාවකි. **සිංහල බෝධි වංශය** සඳහා ආභාසය ලැබී ඇත්තේ **පාලි බෝධි වංසය** වුව ද, ඊට ද ආශ්‍රය වී ඇත්තේ **එළු බෝධි වංශයකි.** එහෙත් අභාග්‍ය නම් මුල් සිංහල වංශ කථා දෘශ්‍යමාන නො වීම යි. නාමමාත්‍රික වීම යි. එබඳු පෞරාණික සිංහල වංශ කථා ඇතුළත් පුස්කොළ පොත් දේශීය හෝ විදේශීය පුස්කොළ පොත් ගබඩාවන්හි සැඟ වී තිබෙන්නට පුළුවන. එබඳු අධ්‍යයනයක් විද්වතුන් හරහා දියත් වුවහොත් ඉතා අගනේ ය. පුස්කොළ පොත් පරිහරණය සම්බන්ධයෙන් පවතින ඉඩ ප්‍රස්තා මීට වඩා පුළුල් විය යුතු ය. පුස්කොළ පොත් ඉබියතුරු ලා එකතැන පැරණි වනවාට වඩා ඒවා පෙරළා බලා අප නො දන්නා ඉතිහාසය හාරා අවුස්සා අනාගත පරපුර වෙත දායාද කිරීම වඩා උචිත යයි මගේ අදහස යි. පුස්කොළ පොත්වල සුරක්ෂිත භාවය හා සංරක්ෂණය වෙනුවෙන් ඉතිහාසය හා සම්භාව්‍ය සාහිත්‍ය අගයන විද්වතුන් හරහා කතිකාවතක් ගොඩනැගීම අවශ්‍යය ය.

මෙම අධ්‍යයනය සඳහා භාවිත කරන ලද පොත්පත් ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය යටතේ නිගමනයට පසු ව දක්වා තිබේ. නිබන්ධයේ අන්තර්ගත කරුණුවලට සබඳකමක් දක්වන්නා වූ අමතර කරුණු උපග්‍රන්ථය යටතේ අවසානයේ දැක්වෙයි.

# හැඳින්වීම

වංශ කථා ඓතිහාසික මූලාශ්‍රයෝ ය. ඒවායෙන් අනාවරණය කෙරෙන ඉතිහාසය ශාස්ත්‍රීය අතින් ඉහළ ය. පාලි වංස කථා සාහිත්‍යය සම්බන්ධයෙන් ලියවුණු ශාස්ත්‍රීය ග්‍රන්ථ අප සාහිත්‍යයෙහි සුලභ ය. ඊට සාපේක්ෂක ව බලන කල්හි, පාලියෙන් පැවති වංශ කථා සාහිත්‍ය හෙළ බසට නගා හෝ හෙළ බසින් රචිත වංශ කථා සාහිත්‍යය හෝ පිළිබඳ ලියවුණු ශාස්ත්‍රීය ග්‍රන්ථ විරල ය. සිංහල වංශ කථා සම්බන්ධ විමර්ශනාත්මක කෘති දක්නට ලැබෙන්නේ ද අඩු ප්‍රමාණයකි. එ කී කාරණය සැලකිල්ලට ගෙන නිබන්ධ මාතෘකාව තෝරා ගැනිණි.

මෙම පර්යේෂණයෙන් ඉදිරිපත් කෙරෙන්නේ 14 - 16 සියවස්හි රචිත සිංහල වංශ කථා පිළිබඳ ශාස්ත්‍රීය විමර්ශනයකි. 14 - 16 සියවස් සමයට අයත් වන්නේ කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ අවධීන් ය. එකල සම්පාදිත සිංහල වංශ කථා නාමයෙන් යුත් ග්‍රන්ථ හයකි. ඒවා පිළිබඳ ශාස්ත්‍රීය ඓතිහාසික විමර්ශනයක් පරිච්ඡේද පහක් මගින් ඉදිරිපත් කෙරෙයි. **ස්තූප වංශය, සිංහල බෝධි වංශය, අනාගත වංශය,** ගම්පොළ සමයේ දී රචිත **අත්තනගලු වංශය**, කෝට්ටේ සමයේ දී රචිත **අත්තනගලු** වංශය හා **චූල බෝධි** වංශය එම ග්‍රන්ථ හයයි.

පළමු පරිච්ඡේදයෙන් මේ එකිනෙක වංශ කථාව රචිත සමය, කතුවරයා ආදී මූලික කරුණු දක්වා ඒවායෙහි අන්තර්ගතය පිළිබඳ විස්තර සපයා තිබේ. එකිනෙක වංශ කථාවේ මුද්‍රිත සංස්කරණ එකතුවක් ද සකස් කර ඇත. මෙතෙක් මුද්‍රණයට පත් නො වූ පුස්කොළ පොත් දෙකක් (**සේරුවාවිල ස්තූප වංශය** හා **අනාගත වංශ කාව්‍යය**) පිළිබඳ විස්තර ද සපයා තිබේ. අධ්‍යයනයට මූලික වූ ග්‍රන්ථ ලියා ඇති භාෂාවේ විශේෂතා පිළිබඳ විමසුම දෙවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් වේ. තෙවන පරිච්ඡේදයෙන් මේ ග්‍රන්ථයන්හි ඓතිහාසික වටිනාකම ද, සිව්වන පරිච්ඡේදයෙන් එ මගින් අනාවරණය කෙරෙන කාලීන සමාජ තොරතුරු ද, පස්වන පරිච්ඡේදයෙන් අදාළ වංශ කථා මගින් මූර්තිමත් වන කලා ශිල්ප පිළිබඳ කරුණු ද ඉදිරිපත් වේ.

මෙහි පෙළ ගැස්ම සැකසී ඇත්තේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මගින් ලබා දී ඇති උපදෙස් සංග්‍රහයේ නිර්ණායකයන් පරිදි ය. පාදක සටහන් සඳහා සංකේත භාවිතයේ දී එය භාවිත වන පළමු අවස්ථාවේ දී පමණක් විස්තරාත්මක සටහන දැක්වෙයි. භාවිත සංකේත හා ඒවායේ විස්තරාත්මක යෙදුම් ලේඛනය හැඳින්වීමෙන් අනතුරු ව ඉදිරිපත් කර ඇත. පර්යේෂණය තුළින් අනාවරණය වූ සුවිශේෂී කරුණු නිගමනය යටතේ සඳහන් කෙරෙයි.

පුස්කොළ පොත් හා මුද්‍රිත පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලි, පුස්කොළ පොත්, සිංහල වංශ කථා පිළිබඳ සංස්කරණ යන ප්‍රාථමික මූලාශ්‍රයන් ද, ඉතිහාසය, සාහිත්‍යය හා අදාළ සිංහල වංශ කථා පිළිබඳ විද්වතුන් විසින් ලියා ඇති විචාරාත්මක කෘති ද, පර්යේෂණ කාර්ය සඳහා මහෝපකාරී විය. එම මූලාශ්‍රය ලේඛනය පරිච්ඡේද අවසානයේ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය යටතේ පර්යේෂණ නිබන්ධයෙහි දැක්වේ.

පර්යේෂණයේ නියැලීමේ දී දැන ගන්නට ලැබුණ ඊට සම්බන්ධයක් දක්වන්නා වූ අමතර කරුණු උපග්‍රන්ථය යටතේ දක්වා තිබේ. අනාගත පර්යේෂකයන්ට වැදගත් විය හැකි බැවින් දැනට මුද්‍රණයට පත් නො වූ වංශ කථාවක් වන අනාගත වංශ කාව්‍යයේ ඇතුළත් කවි කිහිපයක් හා පුස්කොළ පොත් පිටපත් පිළිබඳ ලේඛන ද, බෝධි රෝපිත ස්ථාන පිළිබඳ ලේඛන ද ඒ යටතේ ඇතුළත් කර තිබේ.

## සංකේත භාවිතය

| | | |
|---|---|---|
| අ.ව. | | අනාගත වංශය |
| අභි.පු. | | අභිමාන පුස්තිකා |
| කෝ.යු.සි.සා. | - | කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය |
| කෝ.රා.ඉ. | - | කෝට්ටේ රාජධානි ඉතිහාසය හා පුරාවස්තු |
| ග.එ.අ.ව. | - | ගම්පොළ එළු අත්තනගලු වංශය |
| චූ.බෝ.ව. | - | චූල බෝධි වංශය |
| ජා.කෞ.පු.සූ. | - | ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ඉතිහාසය සාහිත්‍යය සූචිකා |
| ධ.ප්‍ර. | - | ධර්මප්‍රදීපිකාව |
| පු.කො.පො. | - | පුස්කොළ පොත |
| පු.කො.පො.නා.(සෝම.) | - | පුස්කොළ පොත් නාමාවලිය (සෝමදාස) |
| පු.කො.පො.නා.(සෝර.) | - | පුස්කොළ පොත් නාමාවලිය (සෝරත) |
| ම.ව. | - | මහාවංසය |
| රා.ව. | - | රාජාවලිය |
| ල.ප්‍ර.පො.නා. | - | ලංකාවේ ප්‍රකාශිත පොත් නාමාවලිය |
| ල.ස්තුප. | - | ලංකාවේ ස්තූපය |
| වි.එ.අ.ව. | - | විදාගම එළු අත්තනගලු වංශය |
| ශ්‍රී.ම.බෝ.ඉ.සංස්. | - | ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඉතිහාසය හා තදනුබද්ධ සංස්කෘතිය |
| ස්තූප ව. | - | ස්තූප වංශය |
| ස.ල. | - | සද්ධර්මාලංකාරය |
| සා.වි. 1 | - | සාහිත්‍ය විත්ති අංක 1 |
| සිං.බෝ.ව. | - | සිංහල බෝධි වංශය |
| සිං.සා.ව | - | සිංහල සාහිත්‍ය වංශය |
| *C.O.P.L.M.* I. | - | *Catalogue of palm leaf Manuscripts* in the library of Colombo Museum volume I |
| Pgs. | - | Pages |

## සාහිත්‍ය සම්පත් සමීක්ෂාව

පර්යේෂණයට අදාළ කරුණු විමර්ශනය කළ ආකාරය මෙයින් විස්තර වේ. මෙම නිබන්ධ මාතෘකාවට අනුව, සමීක්ෂා කළ යුතු සාහිත්‍ය සම්පත් ගබඩා වී ඇත්තේ පුස්තකාල හා ලේඛනාගාර තුළ යි. වංශ කථා සම්බන්ධයෙන් ප්‍රාථමික දත්ත දැක්වීමේ දී පුස්කොළ පොත් ප්‍රධාන ය. අදාළ පුස්කොළ පොත් සමීක්ෂාව සඳහා ජාතික කෞතුකාගාර පුස්තකාලය ප්‍රයෝජනවත් විය. එහි ඇති පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලි හරහා අදාළ පුස්කොළ පොත් සොයා ඒවා සමීක්ෂා කෙරිණි. එම පුස්තකාලයේ ම ග්‍රන්ථ නාමාවලි මගින් සිංහල වංශ කථා සංස්කරණ හා විමර්ශන කෘති සොයා ඒවා පරිශීලනය කෙරිණි. සඟරා නාමාවලි තුළින් අදාළ ශාස්ත්‍රීය ලිපි ලේඛන පිළිබඳ තොරතුරු ලබා ගෙන ඒවා කියවා දත්ත සම්පාදනය කර ගැනීමෙන් පසු කරුණු විශ්ලේෂණයට යොමු විණි.

විද්‍යෝදය පුස්තකාලයේ පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලි ද විමසා බැලිණි. එහි විමර්ශන අංශයේ අදාළ පොත්පත් හා සඟරා අංශයේ විදග්ධ සඟරා සමීක්ෂා කර පර්යේෂණයට අත්‍යවශ්‍ය දත්ත සම්පාදනය කර ගැනිණි. ඒවා කියවා දත්ත සම්පාදනයෙන් පසු කරුණු විශ්ලේෂණයට යොමු වුණි. ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සෙවීම් පුස්තකාලයේ බහුමාධ්‍ය ප්‍රක්ෂේපක හා ලේඛනගත තොරතුරු විමසා බැලිණි. පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පරිගණකගත දත්ත සමීක්ෂාවෙන් මුද්‍රිත හා අමුද්‍රිත පොත්පත් පිළිබඳ තොරතුරු සොයා ගැනිණි. පන්සල් කිහිපයකින් කියවීම සඳහා පුස්කොළ පොත් අත් පිටපත් ලබා ගැනීමට උත්සාහ කළ ද, අදාළ වගකිවයුත්තන් විසින් විවිධ කරුණු දක්වා එය මඟ හරින ලදී.

මා ජීවත් වන ප්‍රදේශය අවට පිහිටි පුස්තකාලවලින් ද අවශ්‍ය වූ පොත්පත් සොයා පරිශීලනය කෙරිණි.

කියවීමෙන්, වීමර්ශනය කිරීමෙන්, දත්ත පරීක්ෂා කිරීමෙන් සම්පාදනය කර ගත් සාහිත්‍ය සම්පත් අධ්‍යයනය කොට විමර්ශනශීලී චින්තනයෙන් යුතු ව ක්‍රමානුකූල ව ඒ ඒ

පරිච්ඡේද යටතේ කරුණු සාකච්ජා කර තිබේ. එහි දී මගේ සිතට හැඟුණු ස්වාධීන අදහස් ද පර්යේෂණයට ඇතුළත් කර තිබේ.

මෙම ශාස්ත්‍රීය අධ්‍යයනය සඳහා සමීක්ෂා කරන ලද සාහිත්‍ය සම්පත් හෙවත් මූලාශ්‍රය හා ඒවා පර්යේෂණයට යොදා ගත් ආකාරය පර්යේෂණ ක්‍රමවේදය යටතේ සවිස්තරාත්මක ව දැක් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

14 - 16 සියවස්හි ලියවුණු සිංහල වංශ කථා සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් යනු මානව ශාස්ත්‍ර විෂය ක්ෂේත්‍රයට අයත් වූවකි. මෙම පර්යේෂණ මාතෘකාව විෂයානුබද්ධ තොරතුරු හෙවත් දත්ත අනුව සිදු කළ යුතු පර්යේෂණයකි. එහි දී භාවිත කළ යුත්තේ ලිඛිත මූලාශ්‍රයන් ය. පුස්තකාලය පර්යේෂණ මූලාශ්‍රය ඇතුළත් වැදගත් ආයතනයකි. ලේඛනගත ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරෙන් කරුණු විමර්ශනය කර තිබේ. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය මේ සඳහා අනුගමනය කෙරිණි. ප්‍රථමයෙන් 14 - 16 සියවස් කාලය හඳුනාගෙන පර්යේෂණයට ඇතුළත් විය යුතු කරුණු අන්තර්ගත වන සේ සැකිල්ල සකස් කිරීමෙන් අනතුරු ව තොරතුරු ගවේෂණය කෙරිණි.

සිංහල වංශ කථාවන්හි මූලාශ්‍රය වන්නේ පුස්කොළ පොත් ය. එ බැවින් ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පුස්කොළ පොත් නිතර පරිහරණය කරන්නට සිදු විය.

අදාළ සියවස්හි රචිත සිංහල වංශ කථා හඳුනා ගැනීම මූලික ව සිදු විය. අනතුරු ව එකී ග්‍රන්ථ පුස්කොළ පොත් නාමාවලින්හි දක්වා ඇති ආකාරය විමසා බැලිණි. ඒ සඳහා ඩබ්ලිව්.ඒ. සිල්වා විසින් 1938 දී සංස්කරණය කරන ලද **ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය**, වැලිවිටියේ සෝරත හිමි විසින් සකස් කරන ලද, 1959 දී මුද්‍රණය කරන ලද **ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය**, කේ.ඩී. සෝමදාස විසින් 1964 දී සංස්කරණය කළ **ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය** ප්‍රධාන වශයෙන් භාවිතයට ගැනිණි. එකිනෙක නාමාවලින්හි එකම නමින් යුතු පුස්කොළ පොත් කොපමණ පවතී ද යන්න එ මගින් දැන ගත හැකි විය. ප්‍රධාන කොට නොවුණ ද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් කරන ලද සමීක්ෂණයක් ඇසුරෙන් මුද්‍රණය කරන ලද ***"Guide to the Hists of H.M.C. Material",*** නාමාවලිය ද භාවිත විය.

එකම නාමයෙන් යුතු පුස්කොළ පොත් ගණනාවක් පැවතිය ද එක වංශ කථාවක් යටතේ එක පුස්කොළ පොත බැගින් කියවීමට හැකි විය. කෞතුකාගාර පුස්තකාලයේ ඇති **H.8** නමින් යුතු **ස්තූප වංශය**, **W.**8 නමින් යුතු **බෝධි වංශය**, $\frac{6}{C.7}$ නම් අනාගත